# අනාර්ය ශ්‍රමණ සම්ප්‍රදාය

අප කෙදිනක හෝ ලෞකික වූ අපේ ප්‍රවාද ගොඩ නැගීම ආරම්භ කළ යුතු ය. අප අපේ ප්‍රවාද ගොඩ නැගිය යුතු වන්නේ සිංහල බෞද්ධ චින්තනය මත පදනම් වෙමිනි. අප බමුණු චින්තනය නැත්නම් වෛදික චින්තනය හදාරන්නේ ද ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය සමග එය සසඳන්නේ ද ඒ ඒ දැනුම් පද්ධති ගොඩ නැගී ඇත්තේ ඒ ඒ චින්තනය මත පදනම් ව හෙයිනි. අපි විටින් විට ඒ ඒ චින්තනවල ඇති ප්‍රධාන ලක්ෂණ සාකච්ඡා කරමු. අපට අවශ්‍ය වී තිබෙන එක් කරුණක් නම් බුදුන් වහන්සේ විසින් සිදු කරන ලද චින්තන විප්ලවය කුමක්දැයි හඳුනා ගැනීම ය. එය සුසමාදර්ශ වෙනසක් පමණක් නොවන බව ද අපි සඳහන් කෙළෙමු. බුදුන් වහන්සේගේ චින්තන විප්ලවය අපට වඩාත් වැදගත් වන්නේ සිංහල බෞද්ධ චින්තනයට උන්වහන්සේගේ චින්තන විප්ලවය මහත්සේ බලපා ඇති බැවිනි.

සිදුහත් කුමරු උපන්නේ ආර්ය සමාජයක නොවේ. ශුද්ධෝදන රජතුමා ප්‍රාග් වෛදික සමාජයට අයත් ප්‍රාදේශීය පාලකයෙක් විය. මේ සමාජයට ද ආර්ය බලපෑම විය. එහෙත් ඒ අතර ප්‍රාග් වෛදික සම්ප්‍රදායේ තවුසන්ගෙන් ද රජතුමා උපදෙස් ගත් බව පැහැදිලි ය. අසිත තවුසාණන් පිළිබඳ කතාවෙන් ඒ බව හෙළිදරවු වෙයි. පැරණි සමාජයේ ශ්‍රමණ නමින් පිරිසක් වූ බවත් ඔවුන් විමුක්තියක් සෙවූ බවත් පැහැදිලි ය. ඒ එසේ වුවත් සිදුහත් කුමරු උපදින කාලයට ටික කලකට පෙර බමුණන්ගේ හා වෛදිකයන්ගේ සංස්කෘතික ආධිපත්‍යය විශාල වශයෙන් තහවුරු වී තිබුණි. කර්මය, සංසාරය ආදිය අනාර්ය පූර්ව වෛදික සමාජයෙනුත්, බ්‍රහ්මන් සංකල්පය යාග හෝම හා බැඳුණු විමුක්තිය ආර්ය බලපෑමෙනුත් වෛදික සමාජයට හිමි වී තිබුණි. පැරණි අනාර්ය සමාජයේ විමුක්තිය ලබා ගැනීම සඳහා ධ්‍යාන උපදවා ගැනීම කෙළෙස් තැවීම ආදී සංකල්ප හා විධි ක්‍රම තිබුණි.

බමුණන්ට මේ ධ්‍යාන හා කෙළෙස් තැවීම් ගැන අවබෝධයක් නොතිබුණා නොවේ. එහෙත් ඔවුහු යෝග හා ධ්‍යාන වෙනුවට යාග හා හෝම යොදා ගත්හ. යෝග යන්නෙහි තේරුම එකතු වීම යන්න ය. වෙන්වීම වෙනුවට එකතු වීම හරහා විමුක්තිය ලබා ගැනීම යෝග ක්‍රමයෙහි පදනම විය. එය තමන් විසින් ම කර ගත යුත්තක් විය. ධ්‍යානය ද එලෙසම තමන් විසින් අත් පත් කර ගත යුතු තත්වයක් විය. ධ්‍යානයකට සම වැදිය යුත්තේ තමන් ය. මේ සියල්ල තමන්ගේ කාර්යයන් විය. බමුණන්ගේ යාග හා හෝම එසේ නොවී ය. යාගය යදින්නක් මුල් කර ගත්තක් විය. එය බාහිර පුද්ගලයකුගෙන් (දෙවියකුගෙන් බ්‍රහ්මයකුගෙන් ආදී වශයෙන්) විමුක්තිය ලබා ගැනීමක් විය. හෝමය ද බාහිර පුද්ගලයන් වටා බැඳුණු විමුක්තියක් විය. පැරණි අනාර්ය සමාජයේ තිබූ ඒ ඒ පුද්ගලයා තමා විසින් ම තම විමුක්තිය අත් කර ගත යුතු ය යන අදහස වෙනුවට බමුණෝ බාහිර බලයකින් විමුක්තිය ලබා ගත යුතු ය යන අදහස ඉදිරිපත් කළහ.

පැරණි අනාර්ය පූර්ව වෛදික සමාජයේ පරමාත්මය යනුවෙන් සංකල්පයක් වී දැයි නිශ්චිතව ම කිව නොහැකි ය. බ්‍රහ්මන් යන පරමාත්මය වෛදික බමුණන්ගේ නිර්මාණයකි. මා සිතන අයුරින් නම් පූර්ව වෛදික සමාජයේ තිබෙන්නට ඇත්තේ ආත්මය, කර්මය හා සංසාරය යන ප්‍රධාන සංකල්ප ය. කෙළෙස් තැවීමෙන් හා ධ්‍යාන ඉපදවීමෙන් සසරින් එගොඩ වීමට ඔවුන් උත්සාහ කළා විය හැකි ය. තවුසා හෙවත් තාපස යන්නෙහි (කෙළෙස්) තවන්නා යන අර්ථය ගැබ් වී ඇත. තාපය (හෙවත් ශක්තිය) ඇති කරගෙන ඒ තාපයෙන් කෙළෙස් තැවීම මෙහි අරමුණ වෙයි. අසිත තවුසා පමණක් නොව සිදුහත් කුමරු ද මුල දී ඒ සම්ප්‍රදාය තුළ තවුසෙක් විය. එපමණක් නොවේ. සිදුහත් තවුසාණන් විමුක්තිය සොයා ගියේ ද ආළාර කාළාම, උද්දකාරාම පුත්ත වැනි තවුසන් වෙතට ය. සිදුහත් තවුසාණන් විමුක්තිය සොයා යැමේ දී එතුමෝ උන්වහන්සේගේ ගුරුවරු වූහ. ඉන්පසු සිදුහත් තවුසාණන් තවුස්දම් රැක්කේ පස්වග තවුසන් සමග ය. මේ තවුසෝ පංච වාර්ගික වූහ. මෙයින් කියැවෙන්නේ එක් එක් අය එක් එක් වර්ගයකට බැගින් අනාර්ය වර්ග පහකට අයත් වූ තවුසාණන් පස් දෙනකු ගැන බව පැහැදිලි ය.

මෙය ඉතා වැදගත් කරුණක් වෙයි. ශුද්ධෝදන රජතුමා තම පුත් සිදුහත් කුමරු අධ්‍යාපනය සඳහා යැවුවේ සර්වමිත්‍ර බ්‍රාහ්මණයා වෙතට ය. සර්වමිත්‍ර යන්නෙහි තේරුම සියල්ලන්ගේ ම මිතුරා බව ය. සමහරවිට සර්වමිත්‍ර බ්‍රාහ්මණයා අනාර්යයන් ද ඇතුළු සියළු දෙනාගේ මිතුරකු වන්නට ඇත. කෙසේ වුවත් අනාර්ය ගෝත්‍රයක (ගෞතම - සිදුහත් කුමරු සිද්ධාර්ථ ගෞතම විය. එතුමන්ගේ මෑණියන්ගේ නැගනිය ප්‍රජාපතී ගෝතමී වූවා ය.) වංශයක් වූ ශාක්‍යයනට

ද වෛදික බමුණන්ගේ සංස්කෘතික (අධ්‍යාපන) ආධිපත්‍යය කෙතෙක් දුරට බලපා තිබුණේ ද යන්න ඒ කරුණෙන් පැහැදිලි වෙයි. එය එක් අතකින් ගත් කල අද අප අපේ දරුවන් අධ්‍යාපනය සඳහා බටහිරයන් විසින් මෙහෙයවෙන මෙරට හා පිටරට විශ්ව විද්‍යාලවලට හා වෙනත් ආයතනවලට යැවීමට සමාන ය. සිදුහත් කුමරු එසේ අධ්‍යාපනය සඳහා බ්‍රාහ්මණයකු වෙත යැවුණ ද, තරුණ වියේ ලත් ඉගෙනීමෙන් පසුව එතුමා වෙනත් අතක් බලා ඇති බව පැහැදිලි ය. ඇතැම් විට ඉගෙන ගන්නා අතරතුරම තරුණ සිදුහත් කුමරු ඒ ඉගෙන ගත් දෑ ගැන කළකිරෙන්නට ඇත. කුමරුගේ ඉගෙනුම සම්බන්ධයෙන් නෑදෑයන්ට යම් විචිකිච්ඡාවක් පහළ වී නම් එයට හේතුව සිදුහත් කුමරු තමන් ලැබූ අධ්‍යාපනය කෙරෙහි දැක්වූ අහිතවත් ආකල්පය විය හැකි ය. සිදුහත් කුමරු ලොව්තුරා බුදු වී මුළු මහත් ලෝකයට ම ශාන්තියක් අත් කරගෙන දීම සමගම උන්වහන්සේ සිදු කළ ලෞකික කටයුතු රාශියක් ද වෙයි. මෙහි දී අප සාකච්ඡා කරන්නේ ඉන් ප්‍රධාන ලෞකික කටයුත්තකි.

අධ්‍යාපනය ලත් අවධියේ නොවී නම් ඒ ආසන්න කාලයක වෛදික බ්‍රාහ්මණ සම්ප්‍රදාය පදනම් වූ චින්තනය සිදුහත් කුමරු විසින් ප්‍රතික්ෂේප කරන ලද බව පැහැදිලි ය. එහෙත් ඒ ප්‍රතික්ෂේප කිරීමට පෙර එතුමාට බ්‍රහ්මණ සම්ප්‍රදාය තුළ ලබාගත හැකිව තිබූ ඉහළම අධ්‍යාපනය ලබා ගැනීමට හැකි වූ බවට සැකයක් නැත. සිදුහත් කුමරු ලෝකොත්තර වශයෙන් ගත්කල ගිහිගෙහි කළකිරුණාක් මෙන් ම ලෞකික වශයෙන් ගත්කල වෛදික චින්තනය ගැන ද කළ කිරෙන්නට ඇත. සමහර විට ගිහිගෙහි කළකිරීමේ දී මේ කරුණ ද බලපාන්නට ඇත. සතර පෙර නිමිතිවල අවසන් නිමිත්ත පැවිද්දකු විය. මේ පැවිද්දා ශ්‍රමණ තවුසකු වූ බව පැහැදිලි ය. සිදුහත් කුමරු යා යුතු මග තීරණය කරන්නට ඇත්තේ කවුරුන් දැකීමෙන් පසුව ද යන්න නිගමනය කිරීම අපහසු කරුණක් නොවේ. එතුමා විමුක්තිය සොයා ගමන් කෙළේ අනාර්ය සම්ප්‍රදාය වෙතට මිස බ්‍රාහ්මණ යාග හෝම වෛදික සම්ප්‍රදාය වෙතට නොවේ.

අනාර්යයන් වර්ධනය කර ගෙන තිබූ කර්මය සංසාරය හා ආත්මය හෝ වෙනත් එවැනි සංකල්පයක් මත පදනම් වී වෛදික බමුණන් පරමාත්මය ගෙවත් බ්‍රහ්මන් යන සංකල්පය ගොඩ නගන්නට ඇතැයි සිතිය හැකි ය. එසේ කීම සඳහා නිශ්චිත සාධක නොමැති වුවත් බ්‍රහ්මන් යන සංකල්පය අවසාන වශයෙන් ගත්කල සේවය කෙළේ හා කරන්නේ වෛදිකයනට හා පසුකාලීන බ්‍රාහ්මණයන්ට හා ක්‍ෂත්‍රියයනට බව තේරුම් ගැනීමේ දී ඒ අනුමානය තව දුරටත් තහවුරු වෙයි. සිදුහත් කුමරු වෛදික සම්ප්‍රදාය මුලදී ම ප්‍රතික්ෂේප කෙළේ ය. සිදුහත් කුමරු සිදුහත් තවුසාණන් බවට පත්වූයේ ම එකල දඹදිව තිබූ අධිපතිවාදී වෛදික බ්‍රාහ්මණ චින්තනය ප්‍රතික්ෂේප කර අනාර්ය පූර්ව වෛදික චින්තනයට ප්‍රසිද්ධියේ ම ආපසු යැමෙනි. බ්‍රහ්මන් යාග හෝම ආදිය පමණක් නොව ඊනියා ආර්ය කුල ක්‍රමය හා වියුක්ත දැනුම් ද ඒ සමග සිදුහත් තවුසාණන් අතින් ප්‍රතික්ෂේප විය.

වියුක්ත දැනුම් පිළිබඳ අපි සාකච්ඡා කර ඇත්තෙමු. ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය තරමට ම නැති වුව ද, වෛදික බමුණු යුදෙව් චින්තනය ද යම් ප්‍රමාණයකට වියුක්ත වෙයි. සාධාරණීකරණය (ජෙනරලයිසේෂන් - සාමාන්‍යකරණය කිරීම) වියුක්ත චින්තනයේ අංගයකි. වෛදික බමුණන්ට වියුක්තකරණය ඔස්සේ බටහිර ගණිතය වැනි වියුක්ත දැනුම් පද්ධතියක් ගොඩනගාගත නොහැකි වුව ද, ඔවුන්ට බ්‍රහ්මන් වැනි සංකල්පයක් නිර්මාණය කර ගැනීමට හැකි විය. ඇතැම් විට වෛදික බමුණන්ට බටහිර විද්‍යාව වැනි දැනුම් පද්ධතියක් ගොඩනගා ගැනීමට නොහැකි වීමට මුල් වූ ප්‍රධාන කරුණු අතර ඔවුන්ගේ චක්‍රීය චින්තනය වන්නට ඇත. බටහිර ගණිතය ඉතාමත් වියුක්ත දැනුම් පද්ධතියක් පමණක් නොව ඒක රේඛීය චින්තනය මත පදනම් වූයේ ද වෙයි. භාරතීය විද්‍යාවන් හා ගණිතය ග්‍රීක ස්වසිද්ධිමූලක (ඇක්සියොමැටික්) පද්ධතියක් මෙන් ගොඩ නැගී නැත. වෛදික බමුණන්ගේ චක්‍රීය චින්තනය අනාර්යයන්ගෙන් ගත් එකක් විය යුත්තේ ආර්යයන්ට ඒ අඩංගු චින්තනයක් තිබූ බවට සාක්ෂි නොමැති වීම හේතුකොට ගෙන ය.

සිදුහත් කුමරු උපන් අවධියෙහි දඹදිව දේශපාලන වෙනස්කම් ද සිදුවෙමින් පැවති යුගයකි. විශේෂයෙන් ම සොළොස් මහ ජනපදවල පැවති ඇතැම් ගණ රාජ්‍ය (අද අර්ථයෙන් නම් සමූහාණ්ඩු වැනි රාජ්‍ය) වෙනුවට තනි රජවරුන්ගේ රාජධානි (රාජාණ්ඩු - මොනාර්කි) ගොඩ නැගීමක් මෙකල දක්නට ලැබෙයි. ගණ රාජ්‍ය අනාර්ය සම්ප්‍රදායට අයත් අතර රාජාණ්ඩු වෛදික චින්තනය මත පදනම් වෙයි. උදාහරණයක් ලෙස ගතහොත් ලිච්ඡවි හා වජ්ජිපුත්තක කුමාරවරු අනාර්ය ගණ රාජධානි පවත්වාගෙන ගිය අතර බිම්බිසාර, කොසොල් වැනි රජවරු රාජාණ්ඩු ගොඩ නැගූහ. එමෙන් ම ඒ යුගය වෙළෙඳුන්ගේ හා සිටුවරුන්ගේ ද බලය වැඩි වූ කාලයකි. මේ පැරණි භාරතයේ විවිධ

© Prof. Nalin De Silva

චින්තන එකට ගැටුණු අවස්ථාවක් විය. රජවරුන්, වෙළෙඳුන් හා සිටුවරුන් ශක්තිමත් වීම සමග බමුණන්ගේ බලය යම් ප්‍රමාණයකට අඩු විය. දේශපාලනය, ආර්ථිකය හා සංස්කෘතිය අතර අන්තර් සම්බන්ධකම් තිබෙන අතර ම ඒවාහි යම් ස්වාධීනත්වයක් ද වෙයි. දේශපාලනය, ආර්ථිකය හා සංස්කෘතිය සමාන්තර ව විකාශය නොවන අවස්ථා ද වෙයි. බුද්ධකාලීන භාරතය ඒ සඳහා හොඳ උදාහරණයක් වෙයි.

සිදුහත් කුමරු තවුස්දම් රැකීමට ගියේ එක් පැත්තකින් දේශපාලනයෙහි වෛදික චින්තනය ජයගනිමින් පැවති අවස්ථාවක ය. එහෙත් ඒ හේතුව නිසා ම නොවුණ ද බ්‍රාහ්මණ බලය තරමක් යටපත් වෙමින් පැවතුණි. කරුණු කිහිපයක් නිසා එය එසේ සිදු විණි. රජකමට පත් ක්ෂත්‍රියයෝ බ්‍රාහ්මණයන්ට යටත් වීමට අකමැති වූහ. දෙවනු ව වෙළෙන්දෝ හා සිටුවරු ද සමාජයේ යම් බලයක් අත් කර ගැනීමෙන් බ්‍රාහ්මණ ආධිපත්‍යයට අභියෝග කළහ. තුන්වැනුව සංස්කෘතික ක්ෂෙත්‍රයෙහි ලෝකෝත්තර දැනුම, වත් පිළිවෙත් සම්බන්ධයෙන් ගත් කල බ්‍රාහ්මණ මතවාදවලට අභියෝග කිරීමට අනාර්ය ප්‍රාග් වෛදික සංස්කෘතික මතිමතාන්තරවලට හැකි විය. එසේ වුව ද අනාර්ය ශ්‍රමණයන් ලෞකික ක්ෂෙත්‍රයන්හි දැනුම නිර්මාණය කිරීම අතපසු කිරීම හා එසේ දැනුම නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පදනම සකසා නොගැනීම හේතුවෙන් අවසානයේ දී වෛදික චින්තනය මත පදනම් වූ ලෞකික දැනුම නිර්මාණය කළ බ්‍රාහ්මණයෝ ජයගත්හ. යම් අයුරකින් අනාර්ය ශ්‍රමණ සම්ප්‍රදාය තුළ ලෞකික දැනුම නිර්මාණය කිරීමේ මාර්ගයක් සකසා ගෙන තිබුණි නම් භාරතයේ ඉතිහාසය මුළුමනින් ම වෙනස් මගක ගමන් කිරීමට තිබුණි.

මේ කරුණින් කියැවෙන්නේ යම් චින්තනයක් තුල දැනුම නිර්මාණය කිරීම කෙතරම් වැදගත් ද යන්න ය. එදා පරාජය අබියසට ගිය වෛදික චින්තනයට හා බමුණන්ට ජය ගැනීමට හැකි වූයේ ඔවුන් ශ්‍රමණයන් මෙන් නොව විමුක්තියට සම්බන්ධ ලෝකෝත්තර දැනුමට පමණක් සීමා නොවී ලෞකික දැනුම් ද ගොඩනගා ගැනීමට උනන්දු වූ බැවිනි. අද බටහිරයන් අප පාලනය කරන්නේ දේශපාලනයට හා ආර්ථිකයට වඩා සංස්කෘතික වූ දැනුමට පින් සිදුවන්නට ය. විශේෂයෙන් ම බටහිරයන් එහි දී උපයෝගී කරගන්නේ බටහිර විද්‍යාව හා බටහිර තාක්ෂණය යැයි හැඳින්වෙන ලෞකිකයට බර වූ දැනුම ය. මේ වන විට ලෞකික නොවන දැනුමෙන් අපට බටහිරයන් පරාජය කළ හැකි ය. ඒ එදා ශ්‍රමණ සම්ප්‍රදායට ලෞකික නොවන දැනුමෙන් බ්‍රාහ්මණ සම්ප්‍රදාය පරාජය කිරීමට හැකි වූ අයුරින් ය. එහෙත් අප ජය ගැනීමට නම් අපේ චින්තනය තුළ ලෞකික දැනුම් පිළිබඳ අපේ ප්‍රවාද ගොඩනගා ගත යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva